අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. } ED/3/37/1/133 Sub
ඔබේ යොමුව / உமது இல. / Your Ref. }
දිනය / திகதி / Date } 2022 නොවැම්බර් 04

චක්‍රලේඛ අංක: 03/2020 (i) උපදෙස් හා මාර්ගෝපදේශ අංක: 02

සියලුම: පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
කොට්ඨාශ භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත

**පාසල් පද්ධතියේ දැනට ක්‍රියාත්මක වන පාසල් අතුරින් තෝරාගත් පාසල් ජාතික පාසල් ලෙස වැඩිදියුණු කිරීම තුළින් ජාතික පාසල් සංඛ්‍යාව 1,000 ක් දක්වා ඉහළ නැංවීම**

**හා**

**අංගසම්පූර්ණ ත්‍රෛභාෂා ද්වීතියික ජාතික පාසල් 20 ක් දිස්ත්‍රික්ක මට්ටමින් ස්ථාපිත කිරීම**

**සහ**

**එම පාසල් සම්බන්ධ කරමින් කේන්ද්‍රීය පාසලක් සහිත පාසල් ජාලයක් (school network) ස්ථාපිත කිරීම.**

පාසල් පද්ධතියේ දැනට ක්‍රියාත්මක වන පාසල් අතුරින් තෝරාගත් පාසල් ජාතික පාසල් ලෙස වැඩිදියුණු කිරීම තුළින් ජාතික පාසල් සංඛ්‍යාව 1,000 ක් දක්වා ඉහළ නැංවීම හා අංගසම්පූර්ණ ත්‍රෛභාෂා ද්වීතියික ජාතික පාසල් 20 ක් දිස්ත්‍රික්ක මට්ටමින් ස්ථාපිත කිරීම සහ එම පාසල් සම්බන්ධ කරමින් කේන්ද්‍රීය පාසලක් සහිත පාසල් ජාලයක් (school network) ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2020.01.01 දිනැති අංක 03/2020 චක්‍රලේඛයට වැඩිමනත් වශයෙනි.

02. රටේ පවත්නා ආර්ථිකමය අර්බුද තත්වය හමුවේ දේශීය අරමුදල් භාවිතයෙන් සිදුකරන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය වියදම් සීමා කිරීමට සිදුවීම හේතුවෙන් මෙම වැඩසටහන සංශෝධනය කිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගතයුතුව ඇත.

i. ඒ අනුව මෙම වැඩසටහන යටතේ කිසිදු ජාතික පාසලක් පිහිටා නොමැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පිහිටි, නිර්ණායක හා සිතියම්කරණ අභ්‍යාසය හරහා හඳුනාගත් වඩාත්ම ගැළපෙන එක් පාසලක් බැගින් සංවර්ධනයකිරීමට යෝජිතය. එහිදී මේවන විට ජාතික පාසල් බවට පත්කර ඇති පාසල් සහිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 14හි පාසල් හැරුණුකොට ඉතිරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 111හි වඩාත්ම සුදුසු පාසල් 111 තෝරා ගැනීමට නියමිතය.

ii. මේ සඳහා ප්‍රාදේශීය අවශ්‍යතා, ප්‍රාදේශීය විෂමතා හා පහත සඳහන් සාධකද, සැලකිල්ලට ගෙන, 03/2020 චක්‍රලේඛයේ 4.1 (ix) හි සඳහන් නිර්ණායකයට අදාළ සීමාව පිළිබඳව තීරණය කිරීමේ බලය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත පැවරේ.

(අ) ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා, සිදු කරනු ලැබූ පාසල් සිතියම්ගත අභ්‍යාසයෙන් හඳුනාගත් ප්‍රමුඛ පාසල් පිළිබඳවද සැලකිල්ලට ගතයුතුය.

(ආ) දැනටමත් පාසල් වෙනුවෙන් සිදුකර ඇති ආයෝජනයන්හි උපරිම උපයෝජනය සිදුවන අයුරින් මෙම පාසල තෝරාගත යුතුය.

(ඇ) පාසල්වල දැනටමත් සිදුකර ඇති රාජ්‍ය ආයෝජන පිළිබඳව සැලකිල්ලට ගැනීමේදී විශේෂයෙන් දැනට පවතින තොරතුරු තාක්ෂණ පහසුකම් සැලකිල්ලට ගත යුතුය.

(ඈ) කේන්ද්‍රීය පාසල 1-13 හෝ 6-13 ශ්‍රේණි සහිත පාසලක් විය යුතුය.

03. ඒ අනුව මේ වන විට කිසිදු ජාතික පාසලක් පිහිටා නොමැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි පිහිටා ඇති වඩාත්ම සුදුසු පාසල නිර්ණායක අනුව හා ස්ථානීය පරීක්ෂණයක් සිදුකර තෝරාගෙන එම පාසල් ලැයිස්තුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය හා පළාත් ගරු ආණ්ඩුකාරවර අනුමැතිය සහිතව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත 2022 නොවැම්බර් 25 වන දිනට ප්‍රථමව ඉදිරිපත් කල යුතුය.

04. මෙම වැඩසටහන සම්බන්ධයෙන් යම්කිසි ප්‍රතිපත්තිමය ගැටළුවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් වන අවසන් තීරණ ගැනීමේ බලය අධ්‍යාපන ලේකම් සතු වේ.

එම්.එන්.රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

**පිටපත්:**

1. ලේකම්, මුදල් අමාත්‍යාංශය
2. සභාපති, මුදල් කොමිෂන් සභාව
3. විගණකාධිපති
4. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
5. සියලුම අතිරේක ලේකම්වරුන්, අධ්‍යාපන අමාත්‍යාංශය
6. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
7. කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
8. කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
9. අධ්‍යක්ෂ ජනරාල් (මුදල්), අධ්‍යාපන අමාත්‍යාංශය
10. ප්‍රධාන මූල්‍ය නිලධාරී, අධ්‍යාපන අමාත්‍යාංශය
11. සියලුම අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, අධ්‍යාපන අමාත්‍යාංශය
12. අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්), අධ්‍යාපන අමාත්‍යාංශය
13. අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා සැලසුම්), අධ්‍යාපන අමාත්‍යාංශය
14. අභ්‍යන්තර විගණක, අධ්‍යාපන අමාත්‍යාංශය